මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, අංක 02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**2025.03.04**

මාධ්‍ය නිවේදන අංක : **LAE/2025/02**

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025

## තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට අපේක්ෂා කරන ඒ සඳහා සුදුසුකම් ලත් රජයේ නිලධාරීන්/ ආරක්ෂක අංශ නිලධාරීන් වෙත කරනු ලබන නිවේදනයයි.

2025.03.03 දින නාම යෝජනා කැඳවීමේ දැන්වීම නිකුත් කළ පළාත් පාලන ආයතන 336 හි ඡන්ද විමසීම සඳහා තැපෑලෙන් ඡන්දය දීමට සුදුසුකම් ලැබුවන්ගේ අයදුම්පත් භාර ගැනීමේ කාල සීමාව **2025.03.03** දින සිට **2025.03.12** දින මධ්‍යම රාත්‍රී 12.00 ට අවසන් වීමට නියමිත ය. එම දිනය කිසිසේත්ම දීර්ඝ කරනු නොලැබේ. එසේම තැපැල් ඡන්ද අයදුම්පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙතින් ලබාගැනීම හෝ මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට ( www.elections.gov.lk ) පිවිසීමෙන් බාගත කළ හැකිය.

02. මෙම ඡන්ද විමසීමේ දී එම පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ඡන්දහිමියන් ලෙස ලියාපදිංචිව සිටින හා ඡන්ද විමසීම් රාජකාරී සඳහා යෙදවීමට නියමිත සියලුම රජයේ නිලධාරීන්/සේවකයන්, විදුහල්පතිවරුන් හා ගුරුවරුන්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිලධාරීන්/සේවකයන්, තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්/ සේවකයන්, දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්/සේවකයන් සහ ත්‍රිවිධ හමුදාවන්හි පොලිස් දෙපාර්තමේන්තුවේ සහ සක්‍රිය ආරක්ෂක සේවාවල යොදවා ඇති සිවිල් ආරක්ෂක බලකායේ සාමාජික සාමාජිකාවන්, අපේක්ෂකත්වය නිසා තමාට වෙන් කරන ලද ඡන්ද පොළේ දී පෞද්ගලිකව ඡන්දය දීමට නොහැකි වන බව හෝ එසේ වීමට ඉඩ ඇති අපේක්ෂකයන් තැපෑලෙන් ඡන්දය දීම සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන අතර, තැපෑලෙන් ඡන්දය දීම සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ කාල සීමාව අවසන් වන තෙක් නොසිට නොපමාව ස්වකීය ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ලෙස තැපෑලෙන් ඡන්දය දීම සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන සියලුම දෙනාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. තවද, මෙම ඡන්ද විමසීමේ දී තැපෑලෙන් ඡන්දය දීම පිණිස ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ දී ඒ සඳහා වූ තොරතුරු 2024 පළාත් පාලන ආයතන ඡන්දහිමි නාමලේඛනයෙන් නිවැරදිව ලබාගත යුතු බව ද අවධාරණය කරනු ලැබේ.

03. සහතික කිරීමේ නිලධාරීන් විසින් තැපැල් ඡන්ද අයදුම්පත් පෞද්ගලිකවම පරීක්ෂා කර ඉල්ලුම්කරුගේ අනන්‍යතාව පිළිබඳව නිසැක වී සහතික කළ යුතු බවත්, සහතික කරනු ලැබූ අයදුම්පත් හැකි වහාම එම අයදුම්කරු ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී වෙත **2025.03.12** දින හෝ එදිනට පෙර අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට ලැබෙන සේ යැවිය යුතු බවත්, එම දිනය නැවත දීර්ඝ නොකරන බවත්, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවත් සියලුම සහතික කිරීමේ නිලධාරීන් වෙත කාරුණිකව දන්වා සිටිනු ලැබේ. තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගන්නා අවසන් දෙදින තුළ දී සහතික කරන අයදුම්පත් තැපෑලට භාරදීම වෙනුවට කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට ගෙනවිත් භාරදීම වඩාත් යෝග්‍ය බව සැලකීම යෙහෙකි.

04. තැපැල් ඡන්ද ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍යවන 2024 ඡන්දහිමි නාමලේඛන තොරතුරු මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය. ඊට අමතරව අවශ්‍යවන තොරතුරු ලබාගැනීම සඳහා 2024 පළාත් පාලන ආයතන ඡන්දහිමි නාමලේඛන පහත සඳහන් ස්ථානවල දී ද ප්‍රදර්ශනය කෙරේ.

i. සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල (කච්චේරිවල) } (අදාළ දිස්ත්‍රික්කයට අයත් නාමලේඛන)
ii. සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල }
iii. සියලුම පළාත් පාලන ආයතනවල (එක් එක් පළාත් පාලන බල ප්‍රදේශයට අයත් නාමලේඛන)
iv. සියලුම ග්‍රාම නිලධාරී කාර්යාලවල (එක් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් නාමලේඛන)

05. මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගත ක්‍රමයට තැපැල් ඡන්ද අයදුම්පත්‍ර සම්පූර්ණ කර ගැනීම සඳහා පහසුකම් සපයා දී තිබේ. ඡන්දහිමි නාමලේඛනයේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් නොවන අයදුම්කරුවන් ඉහත අංක 4 හි සඳහන් ස්ථානයකින් ස්වකීය ලියාපදිංචියට අදාළ තොරතුරු ලබාගෙන අයදුම්පත්‍ර සම්පූර්ණ කළ යුතු වේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්